**FIAN**
**SRI LANKA**
Food First Information & Action Network Sri Lanka
ආහාර මූලික කොටගත් තොරතුරු හා ක්‍රියාකාරී ශ්‍රී ලංකා ජාලය
உணவை பிரதானமாகக்கொண்ட தகவல் மற்றும் நடவடிக்கைக்கான இலங்கை வலைபின்னல்

+94 112 802498
+94 773 273651
fiansl2017@gmail.com
www.fiansrilanka.lk
54, Wijerama Lane,
Gangodawila, Nugegoda, Srilanka.

05-10-2020

ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

ජාතික පෝෂණ ප්‍රතිපත්තිය

සෞඛ්‍ය අමාත්‍යංශය

කොළඹ

**<u>ෆියැන් ශ්‍රී ලංකා ආයතනය මෙම ප්‍රතිපත්තියට ලබා දෙන අදහස් විවේචන</u>**

ප්‍රිය මැතිනියණි / මැතිතුමණි

ශ්‍රී ලංකාවේ පෝෂණය පිලිබඳව සලකා බැලිමේදී පෝෂණ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පිලිගෙන නැවතත් එය යාවත් කාලින කිරිම සඳහා පියවර ගැනිම පිලිබඳ ෆියැන් ශ්‍රී ලංකා ආයතනය ඔබට ස්තුතිවන්ත වෙමු. මෙම ලියවිල්ලේ සිංහල දෙමළ සහ ඉංග්‍රිසි ලියවිලි ගත්විට එකකට එකක් පරිවර්ථනීය දෝෂ දැකිය හැකිය. සාමාන්‍යයෙන් රජයේ ප්‍රතිපත්තියක සිංහල ලියවිල්ල පාදක ලියවිල්ල වුවද මෙහි ඉංග්‍රිසි ලියවිල්ල පාදක ලියවිල්ල ලෙස ගත යුතු බව පෙනේ.

ශ්‍රී ලංකාව තුල පෝෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිමේ ආයතනය වන, සෞඛ්‍ය අමාත්‍යංශය විසින් මෙම ප්‍රතිපත්තිමය ලියවිල්ල ඉදිරිපත් කරනු ලබන අතරම මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරලීම හා අධීක්ෂණය කරලිමේ ප්‍රධානම යාන්ත්‍රණය වූ ජාතික පෝෂණ ලේකම් කාර්යාලය වසා දැමීම සිදු කරන ලද බරපතලම වැරැද්දක් ලෙස පෙන්වා දෙනු කැමැතෙමු. රජයේ සෞඛ්‍ය ක්‍රියාවලිය යටතේ ප්‍රධාන ආයතනයක් ලෙස ඉතා අත්‍යාවශ්‍ය වූ ක්ෂේත්‍රයක් අධීක්ෂණය හා මෙහෙයුම් සිදු කල අංශයක් වූ ජාතික පෝෂණ ලේකම් කාර්යාලය අහෝසි කරලිම මෙම පෝෂණ ප්‍රතිපත්තිය ඉදිරියේ ක්‍රියාත්මක කිරිමට ඇති ප්‍රධාන බාධාව ලෙස දැකිය හැක. ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ප්‍රතිපත්තිය මෙන්ම සෞභාග්‍යයේ දැක්ම සඳහා තවදුරටත් උපකාරි විය හැකි ප්‍රධානම අංශයක් ලෙස පෝෂණ අංශය සඳහන් කල හැක්කෙමු. රටේ මන්දපෝෂණය එක් පැත්තකින් ඉහල යද්දි ස්ථුලතාවය හා අධිපෝෂණය තවත් පැත්තකින් අපට විසඳිය යුතු ගැටළු ලෙස මතුව තිබේ. සුව දිවියක් පිලිබඳ සෞභාග්‍ය දැක්මේ සඳහන් කර ඇති කාරනා මෙම ප්‍රතිපත්තිය තුල දක්නට නැත.

විශේෂයෙන් ආහාර අද වන විට වෙළඳ භාන්ඩයක් වී ඇති නිසාම එහි තත්වය පිලිබඳව පාරිභෝගිකයන්ගේ අවධානය යොමුව ඇත්තෙමු. එහෙයින් අග්නිදිග ආසියා කලාපය ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානයේ මැදිහත් වීම තුලින් සකසා ඇති ප්‍රතිපත්ති රාමුව හා උපාය මාර්ගය සැලැස්ම (The Regional Food safety Strategy for WHO South East Asia ) පිලිබඳව මෙම ප්‍රතිපත්තියේ යොමුවක් නොමැති වීමත් විශේෂයෙන් සඳහන් කරනු කැමැත්තෙමු.

තවද ෆියැන් ශ්‍රී ලංකා ආයතනය ලෙස අපට පෙනී යන්නේ රටේ පුරවැසියන්ගේ ආහාර අයිතිය වෙනුවෙන් මෙම පෝෂණ ප්‍රතිපත්තිය තුල සාධනිය යම් යම් කාරණා ඇතුලත් වුවද රටේ මන්දපෝෂණ වලක්වා ගත නොහැකි ගැටළුවක් බවට පත්ව ඇත්තේ ආහාර නොමැති කම නිසා නොවන බව පැහැදිලිය. ආහාර සඳහා ලඟාවීමට ඇති නොහැකියාව හා දරිද්‍රතාවය යන සමාජමය කරණා හා ආර්ථික කාරණා සැලකිල්ල නොගැනීම හා දේශපාලනික නොදැනුවත් කම හා සංවේදිභාවය නොමැති කම හේතුවක් ලෙස මෙම ලියවිල්ල තුල අවධාරණය කොට නැත.

රටේ පොදු යහපත සඳහා මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරලිමේ වැදගත්කම දකින අතරම ඒ සඳහා ක්‍රියාත්මක විමට ඇති යාන්ත්‍රණය වූ ජාතික පෝෂණ ලේකම් කාර්යාලයක් අහිමි කිරිම පිලිබඳව ජනතා මූලික අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කරන ආයතනයක් ලෙස අපගේ තදබල විරෝධතාවය මෙයින් දක්වමු. එසේම ඔබ ඉදිරිපත් කර ඇති ප්‍රතිපත්ති ලියවිල්ලේ ඇති අපගේ විවේචන, යෝජනා හා එක් කිරිම පහත යා කොට ඇති ලියවිල්ල මගින් ඉදිරිපත් කරමු.

ස්තුතියි



තිලක් කාරියවසම්

සභාපති ෆියැන් ශ්‍රී ලංකා